# සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමේ වරද කුමක්ද?

දෙමළ ත්‍රස්තවාදය පරදවනු ලැබුවේ මෙරට සිංහල ජාතික මතවාදය විසින් බව බොහෝ දෙනාට විශේෂයෙන්ම ඇතැම් ඇමැතිවරුන්ට අමතක වීම පුදුමයක් නො වෙයි. මේ ඇමැතිවරු බොහොමයක් බොරු සමාජවාදියෝ වෙති. තම කඳට සරිලන හිසක් ඔවුන්ට නොමැති වීම ඔවුන්ගෙ නොව ජාතියේ අවාසනාවකි. ආණ්ඩුව පවතින්නේ ඔවුන් නිසා නොව ඔවුන් පවතින්නේ ආණ්ඩුව නිසා බව මොවුහු නො දනිති. මේ අයගෙන් ඇතැම්හු ජනාධිපතිවරණ සමයෙහි දී පිටරට වාසය කළහ. තවත් අය මහින්ද රාජපක්ෂ මහතාට කිසිම සහායක් නො දුන්හ. තවත් පිරිසක් චන්ද්‍රිකා මතවාදය හිසින් ගෙන රාජපක්ෂ මහතාට විරුද්ධව වැඩ කළහ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාතිකවාදී මතවාදය වෙනස් කිරීමට කසිකබල් සතිඅන්ත පත්තරයක කතුවරයකු සමග එකතු වූ මොවුහු විවිධ විජාතික මතවාද අදහති. ඒ ඇදහිල්ලක් මිස අන් කිසිවක් නොවන්නේ තමන් ලත් සුළු බටහිර අධ්‍යාපනයෙන් වුවත් කැඩීමට ඔවුන්ට විචාර බුද්ධියක් නොමැති වීම නිසාය. ඔවුන් කෙසේ වෙතත් ජාතික මතවාදයේ ශක්තිය තේරුම් ගත් මහින්ද රාජපක්ෂ මහතා බොහෝවිට කියා ඇත්තේ තමන්ට බටහිරයන්ට නොනැමී සිටීමට ශක්තිය ලබාදුන්නේ මෙරට ජනතාව බවය. ජනතාව එතැනට ගෙනගියේ ජාතික මතවාද විසිනි. අවසානයේ දී මහින්ද රාජපක්ෂ මහතා දෙමළ ත්‍රස්තවාදයට එරෙහි සටනට නිවැරැදි දේශපාලන නායකත්වය ලබා දුන්නේය. ඒ දේශපාලන නායකත්වය ඔස්සේ ආරක්ෂක ලේකම්තුමා ද ත්‍රිවිධ හමුදාපතිවරු ද සටන් මෙහෙය වූහ. වීරෝදාර රණවිරුවන්ගේ සටනින් දෙමළ ත්‍රස්තවාදය පරාජය විය. එහෙත් දෙමළ ජාතිවාදය තවමත් පරාජය වී නැත. අද බ්‍රිතානිය ප්‍රමුඛ ඇතැම් බටහිර රටවල දෙමළ ජාතිවාදය ඒ රටවල ආණ්ඩු හා විසිරුණු දෙමළ ජනයා මගින් ක්‍රියාත්මක වෙයි.

අද ලෝකයේ ක්‍රියාත්මක වන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදයට එරෙහිව ඇඟිල්ලක් එසවීමට කසිකබල් මාක්ස්වාදීන්ට නොහැකිය. කතෝලික චින්තනය මත පදනම් වූ මාක්ස්වාදයට එක් කලෙක බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අභියෝග කිරීමට හැකිවුවත් අද කතෝලික චින්තනය බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හමුවේ මුළුමනින්ම පැරැදී ඇත. කස්ත්‍රෝ ජාතිකවාදියකු මිස මාක්ස්වාදියකු නොවන බව පැහැදිලිය. ඔහු කියුබානු විප්ලවයෙන් පසු එකල පැවැති ලෝක බල තුලනය විසින් මාක්ස්වාදය දෙසට තල්ලු කරන ලදී. හැට ගණන්වල හා හැත්තෑ ගණන්වල ට්‍රොට්ස්කිවාදීන්ට තිබු විශාල ගැටළුවක් වූයේ කියුබානු රාජ්‍යය කුමක් දැයි විග්‍රහ කිරීමය. මහින්ද රාජපක්ෂ මහතා ද ජාතිකවාදියකු මිස බොරු සමාජවාදියකු නොවන බව අපි දනිමු. 1989 දී මා පළමු බණ්ඩාරනායක සමරු දේශනය පැවැත්වූයේ එවකට බණ්ඩාරනායක සමරු කමිටුවේ සංවිධායක ව සිටි මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනයෙනි. මගේ දේශනයේ මාතෘකාව වූයේ "පනස්හයේ දරුවෝ" යන්නය. මහින්ද රාජපක්ෂ මහතා පනස්හයේ ප්‍රධාන දරුවා වෙයි. එහෙත් එතුමාගේ කැබිනට් මණ්ඩලයේ ඇතැම්හු පනස්හයේ කරුමක්කාරයෝ වෙති. බණ්ඩාරනායක මහතා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමෙන් වරදක් කෙරුවේ යැයි කියන්නෝ පනස්හයේ කරුමක්කාරයෝද වෙති. ඒ මදිවාට බණ්ඩාරනායක මහතාගේ ඊනියා වරද නිවැරැදි කිරීම පිළිබඳ මහින්ද රාජපක්ෂ මහතාට ප්‍රශංසා කරන්නේ සිංහල හා දෙමළ බස් රාජ්‍ය භාෂා කළේ කවුදැයි නොදන්නවුන් මෙනි. මේ බොරු සෝබන සමාජවාදී ඇමැතිවරුන් ඇමරිකාවේ ගත කරද්දී මෙරට ජාතිකවාදීන් ජනමතය සකස් කෙළේ දෙමළ ත්‍රස්තවාදය පමණක් නොව දෙමළ ජාතිවාදය ද පරාජය කිරීමේ අභිලාෂයෙනි. අද බොරු සමාජවාදීහු බටහිරයන් පිටුපස යන ඔවුන්ට ස්තෝත්‍ර ගයන ඔවුන්ගේ මත ප්‍රචාරය කරන හොරණෑ බවට පත්වී සිටිති. මෙරට මාක්ස්වාදී සමාජවාදීන් යැයි කියාගන්න අය ලංකාවේ ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයේ දී බටහිර ලිබරල්වාදීන්ගෙන් වෙනස් නොවෙති.

සිංහල රාජ්‍ය භාෂාව කෙරුණේ මෙරට යටත් විජිත විරෝධී අරගලයෙහි කොටසක් ලෙසය. එයට විරුද්ධවූවෝ හා අද එයට විරුද්ධවන්නෝ යටත්විජිතවාදී බටහිරයන්ගේ දීන සේවකයෝ පමණක්ම වෙති. අප බොහෝ විට සඳහන් කර ඇති පරිදි ඊනියා පාර්ලිමේන්තු පනතක්ම නැතිව වුවද අවුරුදු දහස් ගණනක් තිස්සේ මෙරට රාජ්‍ය භාෂාව වූයේ සිංහලය. ඒ වෙනස් කළෝ යුරෝපීයයෝය. විශේෂයෙන්ම ඉංග්‍රීසීහුය. දහනව වැනි සියවසේ මුල් කාර්තුවේ සිටම ඉංග්‍රීසීහු මෙරට සිංහලත්වය දුර්වල කිරීමට හැකි නම් විනාශ කිරීමට දෙමළ ජාතිවාදය යොදාගත්හ. එහිදී ඔවුන් යොදාගත්තේ ඉංග්‍රීසි උගත් දෙමළ ජනයා ය. 1949 දක්වා ම ඉංගිරිසි උගත් දෙමළ ජනයාගේ දෙමළ ජාතිවාදය විසින් ව්‍යවස්ථාදායකයේ සහ වෙනත් කෙෂත්‍රවල සිංහලත්වයට හිමිවිය යුතුව තිබූ තැන අහිමිකිරීමට ඉංගිරිසි උගත් දෙමළ ජනයා යොදාගත්හ. සර්වජන ඡන්දයත් සමග ව්‍යවස්ථාදායකයෙහි සිංහලයන් සුළුතරය කිරීමට නොහැකි බව

© Prof. Nalin De Silva

තේරුම්ගත් චෙල්වනායගම් 1949 දී උතුර නැගෙනහිර පළාත් සිංහලයන්ට මුළුමනින්ම අහිමි කිරීම සඳහා ලංකා දෙමළ රාජ්‍ය පක්‍ෂය පිහිටුවා ගත්තේය. මිථ්‍යා රාශියක් මත පදනම් වූ දෙමළ ජාතිවාදීහු ඉන්පසු ඉංගිරිසි නොදත් දෙමළ ජනයා ද තම ව්‍යාපාරයට එක්කරගැනීමට උත්සාහ ගත්හ. ප්‍රභාකරන් අවසානයේදී අවි අතට ගත්තේ සිංහලත්වයට එරෙහිවය. ප්‍රභාකරන්ගේ මිනීමැරුම්වලට චෙල්වනායගම් මෙන්ම ඉංගිරිසීන් ද වගකිව යුතුය. ප්‍රභාකරන් බිහිවූයේ සිංහල රාජ්‍ය භාෂාව කිරීම, විශ්ව විද්‍යාල ප්‍රවේශයෙහි දී ඊනියා ලකුණු ප්‍රමිතිය නිසා යැයි තර්ක කරන්නෝ රාජ්‍ය භාෂාව යනු කමක්ද යන්න හෝ ලකුණු ප්‍රමිතිය යනු කුමක්ද යන්න හෝ නොදත් අය වෙති. චෙල්වනායගම් තම බෙදුම්වාදී පක්‍ෂය පිහිටුවා ගත්තේ 1956 ට හා 1972 ට කලකට පෙර බව තේරුම් ගැනීමට මේ අය උත්සාහ නොගන්නේ ඔවුන් මන්ද බුද්ධිකයන් නිසා ම යැයි කිව හැකි නොවේ. ඉංගිරිසින්ගේ සිංහලත්වයට එරෙහි සටන ඉංගිරිසි කතාකරන දෙමළ ජනයාගෙන් ඉංගිරිසි නොදත් දෙමළ ජනයා අතට ගැනීම ප්‍රභාකරන් ඔස්සේ සිදුවිණි. දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසු අද නැවතත් ඉංගිරිසි උගත් දෙමළ ජනයාට ඒ සටන තමන් අතට ගැනීමට සිදුවී ඇත. අද එංගලන්තය ප්‍රමුඛ ඇතැම් බටහිර රටවල කෙරෙන්නේ මේ සටනය.

1815 සිටම දේශප්‍රේමීහු ඉංගිරිසීන්ට විරුද්ධ අරගලයක යෙදුණහ. 1817-18, 1848 දහනව වැනි සියවස අග බෞද්ධ පුනර්ජීවනය, 1956,2005,2009 මේ අරගලයේ නොමැකෙන පියසටහන්ය. 2006-2009 කාලයෙහි අප සටන් කෙළේ මූලික වශයෙන් ඉංගිරිසීන්ට එරෙහිව බවද ප්‍රභාකරන් යනු ඉංගිරිසීන්ගේ නිර්මිතයක් බවද මේ වන විට සිංහලයන් විශාල පිරිසක් අවබෝධ කරගෙන ඇත. අද එංගලන්තයේ හා වෙනත් ඇතැම් බටහිර රටවල ආණ්ඩු ප්‍රසිද්ධියේම සිංහලත්වයට එරෙහිව ඒ රටවල සිටින දෙමළ ජාතිවාදීන්ට ආධාර කරයි. එපමණක් නොවේ. සිංහලත්වයට එරෙහිව කරන සටනට ඇමැතිවරුන් ද සහභාගි කරවීමට විජාතික බලවේග ක්‍රියාකරනු පෙනෙයි. කසිකබල් මාක්ස්වාදීන් ද ඇතුළු සකලවිධ විජාතික බලවේග සිංහලත්වයට එරෙහිව යොදාගැනීමට බටහිරයෝ උත්සාහයක යෙදී සිටිති. විජාතික බලවේග 1956 න් පසු එකරාශි කළ ආකාරයට නැවත වරක් 2009 දී ද විජාතික බලවේග එකතු කිරීමේ වෑයමක් වෙයි. මෙවර විජාතික බලවේග මෙරට ක්‍රියාත්මක වන්නේ දෙමළ ත්‍රස්තවාදය පරාජය කළ සටන සමග එක්වෙමින් වීම හේතුවෙන් තරමක අවුල් සහගත බවක් දකින්නට ඇත. ප්‍රභාකරන් පැරැද්වීම ගැන උදම් අනන අතරම සිංහලය රාජ්‍ය භාෂාව කිරීමට විරුද්ධවන්නේ මේ පසුබිමෙහිය.

අප නැවතත් කියන්නේ සිංහලය රාජ්‍ය භාෂාව කිරීම යනු තනි සිද්ධියක් නොව යටත් විජිත විරෝධී අරගලයේ කොටසක් බවය. 1815 සිට 1956 වන තෙක් රාජ්‍ය භාෂාව වූ ඉංගිරිසිය වෙනුවට සිංහල රාජ්‍ය භාෂාව කිරීමේ වරද කුමක්ද? දෙමළ මෙරට කිසි දිනෙක කිසිම තැනක, ආර්ය චක්‍රවර්තීන්ගේ රාජ්‍යයේවත් (ඒ දෙමළ රාජ්‍යයක් නොවේ) රාජ්‍ය භාෂාව ලෙස තිබී නැත. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා ඉංගිරිසි නොදත් දෙමළ ජනයාට වූ ඊනියා අසාධාරණය කුමක්ද? මේ අයගෙන් යම් පිරිසක් සිංහල දැන සිටි බැවින් ඔවුන්ට ඉන් වාසියක් මිස අවාසියක් සිදු නොවීය. යම් අවාසියක් වී නම් ඒ ඉංගිරිසින්ට, බර්ගර්වරුන්ට, ඉංගිරිසි මිස සිංහල නොදැන සිටි දෙමළ ජනයාට හා ඇතැම් සිංහල නොදත් සිංහලයන්ටය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීමට විරුද්ධවූවෝ මොවුහු, ජාතිය යනු කුමක්දැයි සම්මජාතියේ අවබෝධ කර නොගන්නා කසිකබල් මාක්සිවාදීහු හා සිංහලත්ව විරෝධී ඇතැම් පූජකවරු හා ප්‍රභූහු වූහ. අද ද සිංහලය රාජ්‍ය භාෂාව කිරීම වැරැදි යැයි කියන්නෝ මොවුහු වෙති. යටත්විජිතවාදයට විරුද්ධ යැයි කියන කසිකබල් මාක්ස්වාදීහු ජාතිකත්වය හඳුනාගත නොහැකිව අවසානයේදී යටත්විජිතවාදයට සේවය කරති. බොරු සෝබන සමාජවාදී ඇමැතිවරු ද සිංහලය රාජ්‍ය භාෂාව කිරීම වැරැදි යැයි කියමින් යටත්විජිතවාදයට සේවය කරති. සිංහලය හා දෙමළ දෙකම රාජ්‍ය භාෂා ලෙස ක්‍රියාත්මක විය යුතු යැයි කීමේ අවසාන ප්‍රතිඵලය ඉංගිරිසිය රාජ්‍ය භාෂාව කිරීමය. 1956 දී සිදුවූ යටත්විජිත විරෝධී සටන තේරුම් ගැනීමට නොහැකි ඇමැතිවරුන් මේ ආණ්ඩුවේ ද ඇත්තේ ජාතියේ අවාසනාවටය. මේ ඇමැතිවරුන් නොදන්නා කරුණක් වෙයි. ඒ එක් පැත්තකින් ගත් කල නොදන්නාකමට වඩා තකතීරුකමය. ඔවුහු ඒ කරුණ වුවමනාවෙන් ම අමතක කරති. සිංහලය රාජ්‍ය භාෂාව බවට පත් කළ පනස්හය නොවන්නට මොවුන්ට 2005 දී හා පසුව (ඇතැමුන් විදේශගත වී සිට ආපසු පැමිණියේ 2005 න් පසුය) ඇමැතිකම් ලැබීමට තබා පාර්ලිමේන්තුවට ජාතික ලැයිස්තුවෙන් පැමිණීමටවත් නොහැකි බව ඔවුහු වුවමනාවෙන් අමතක කරති. තේමිස් මහතා, පසුව කවුරුන් වුවද, පාර්ලිමේන්තුවට පත් වූයේ පනස්හයේ ව්‍යාපාරයේ කොටසක් ලෙසය. ඒ ව්‍යාපාරය සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම සමග බද්ධ වී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva